(නවවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(7).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන
# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2020 දෙසැම්බර් 15 අඟහරුවාදා**

---

**2021 ජනවාරි 19 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

9/2020

ගරු හේෂා විතානගේ මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලයට අයත් —

(i) කාර්මික ජනපද සංඛ්‍යාව;

(ii) බිම් ඒකක සංඛ්‍යාව;

(iii) කාර්මික ජනපදවල ක්‍රියාත්මක වන කර්මාන්තශාලා සංඛ්‍යාව;

(iv) කාර්මික ජනපදවල සේවා නියුක්තයන්ගේ සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 2017 වර්ෂයේදී ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය විසින් මධ්‍යම පළාත වෙනුවෙන් —

(i) ස්වයං රැකියා ප්‍රවර්ධනය උදෙසා සිදු කළ වැඩසටහන්;

(ii) එම වැඩසටහන පැවැත් වූ ස්ථාන;

(iii) ලබා දී ඇති උපකරණ;

(iv) ප්‍රතිලාභීන් තෝරාගත් පදනම;

(v) සිදු කරනු ලැබූ තාක්ෂණික පුහුණු වැඩසටහන්;

කවරේද යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ විද්‍යුත් ව්‍යාපාර සිදුකිරීමේ හැකියාව ග්‍රාමීය ප්‍රදේශවල වෙසෙන පුද්ගලයන් සඳහා ද විවෘතව පවතින නමුත්, ඒ සඳහා අවශ්‍ය දැනුම ප්‍රමාණවත් පරිදි ලබා දී නොමැති බව පිළිගන්නේද;

(ii) මෙම දැනුම විධිමත්ව ලබාදීමට කටයුතු කරන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

53/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා රජය සතුව ඇති සංස්ථා, මණ්ඩල, අධිකාරි වැනි ව්‍යවස්ථාපිත ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම ආයතනවල දැනට සිටින සභාපතිවරුන් හා අධ්‍යක්ෂවරුන්ගේ නම් කවරේද;

(iv) එම සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත්කිරීමේදී අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග කවරේද;

(v) එකී ආයතන මූල්‍යමය වශයෙන් ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

100/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධිකරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ජනතාවගේ නීති ගැටලු කඩිනමින් විසඳීමටත්, නීති උපදෙස් ලබා ගැනීමටත්, එක් මහේස්ත්‍රාත් අධිකරණ බලප්‍රදේශයක් සඳහා අවම වශයෙන් එක් නීතිඥ වෘත්තිකයෙකු, පොලිස් නඩු මෙහෙයවීමේ නිලධාරි (prosecutor) ලෙස අදාළ බලප්‍රදේශය වෙනුවෙන් පත් කිරීම තුළින් ශ්‍රී ලංකා පොලිසියෙන් සේවය ලබා ගන්නා ජනතාවට විශාල සේවයක් සිදු වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) උක්ත නව තනතුර ස්ථාපිත කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමේ හැකියාවක් තිබේද;

(ii) එසේ නම්, එම අදාළ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

155/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අඹතලේ, සමුද්‍රදේවී බාලිකා විද්‍යාලයේ මහා මාර්ගයට යාබදව ඇති මහල් තුනකින් සමන්විත ගොඩනැගිල්ලේ බිත්ති ඉරිතැලීමකට ලක්වී ඇති බවත්;

(ii) ඒ හේතුවෙන් එම පාසලේ ඉගෙනුම ලබන සිසු දරුවන්ගේ ජීවිත අවදානමට ලක් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මෙම ගැටලුව විසඳීම සඳහා අමාත්‍යාංශය මඟින් ගෙන ඇති පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

227/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ;

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ බඩ ඉරිඟු ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම බඩ ඉරිඟු ආනයනය කළ රටවල්වල නම්;

(iv) එම බඩ ඉරිඟු ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට බඩ ඉරිඟු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

255/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) බෝපිටිය වතුයාය, මහනුවර දිස්ත්‍රික්කයේ, දෙල්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වතුයායක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 දී රජය සතුව පැවති වතු ප්‍රතිසංස්කරණය කළ අවස්ථාවේදී මෙම වතුයායට අයත්ව තිබූ කොටස් (Divisions) සංඛ්‍යාව කොපමණද;

(ii) එම කොටස්වල නම් කවරේද;

(iii) එම වත්තේ සම්පූර්ණයෙන්ම වගා කළ භූමි ප්‍රමාණය කොපමණද;

(iv) 2015 වර්ෂය වනවිට ඉහත වතුයායේ අතහැර දැමූ කොටස් තිබේද;

(v) එසේ නම්, එම කොටස්වල මුළු බිම් ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 1992 සිට 2015 දක්වා, කාලයේදී මෙම වතුයායට අයත් ඉඩම් සහ ගොඩනැගිලි බාහිර පර්ශ්වයට/පුද්ගලික අංශයට ලබා දුන්නේද;

(ii) එසේ නම්, එම විස්තර කවරේද;

(iii) අවසන් වරට සිදුකළ ඉඩම් සංගණනයට අනුව වගා කළ ඉඩම් හා වගා නොකළ ඉඩම් ප්‍රමාණය කොපමණද;

යන්නත් එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

348/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) නීතිමය තත්ත්වය කෙසේ වුවත්, සංවේදී පරිසර පද්ධතියක මාර්ගයක් ඉදිකරන විට ඒ සඳහා පරිසර බලපෑම් අධ්‍යයනයක් සිදු කළ යුතු බව පරිසරවේදීන් ඇතුළු බහුතර ජනතාවගේ අදහස බැවින් එවැනි අධ්‍යයනයක් සිදු කළ යුතු බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, සංවේදී පරිසර පද්ධතියක් හා ලෝක උරුමයක් වන සිංහරාජ වනාන්තරය හරහා ලංකාගම නමැති ග්‍රාමය වෙත පාරක් කැපීම සඳහා එවැනි අධ්‍යයනයක් සිදු කර තිබේද;

(ii) නොඑසේ නම්, එවැනි අධ්‍යයනයක් සිදු කිරීමට අපේක්ෂා කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) ඉහත (අ)හි සඳහන් අදහස පිළිනොගන්නේ නම්, එයට හේතුව කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

434/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) ඩෙංගු රෝගය විවිධ අවස්ථාවලදී ශ්‍රී ලංකාව තුළ වර්ධනය වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) 2019 වසර තුළ ඩෙංගු රෝගය හේතුවෙන් අහිමි වූ ජීවිත සංඛ්‍යාව කොපමණද;

(ii) ඩෙංගු රෝගය මර්දනය සඳහා ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iii) ප්‍රාදේශිය ඩෙංගු මර්දන වැඩපිළිවෙළ සඳහා බඳවාගත් කම්කරුවන් පිරිසක් සිටින බව පිළිගන්නේද;

(iv) එසේ නම්, ඔවුන්ගේ සේවය අඛණ්ඩව ලබා ගැනීමට සැලැස්මක් තිබේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

545/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ගාල්ල, උණවටුන ප්‍රදේශයේ පිහිටා ඇති රූමස්සල කන්ද ප්‍රදේශය පරිසර සංවේදී කලාපයක් බවට පත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම තීරණය ගැනීමේදී එම කලාපයේ ඉදිකිරීම් කටයුතු සිදු නොකළ යුතු, රජයට අයත් ඉඩම් කොටස් නම් කර ඇති අතර එවැනි නම් කිරීමක් කළ හැකිද;

(ii) මෙම තීරණය හේතුවෙන්, මේ වනවිට අපහසුතාවයට පත්වී සිටින පෞද්ගලික ඉඩම් හිමියන්ට සහනයක් ලබා දිය හැකිද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

556/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ක්‍රියාත්මක කළ ප්‍රධාන ජල යෝජනා ක්‍රම සංඛ්‍යාව කොපමණද;

(ii) එම යෝජනා ක්‍රම මඟින් ආවරණය වන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස සංඛ්‍යාව කොපමණද;

(iii) එමඟින් ආවරණය වන ග්‍රාම නිලධාරි වසම් සංඛ්‍යාව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල සහ ග්‍රාම නිලධාරි වසම්වල නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) එම ජල යෝජනා ක්‍රම සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණය එක් එක් යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(vi) එම ජල යෝජනා ක්‍රම අවසන් කිරීමට නියමිත කාල සීමාව එක් එක් යෝජනා ක්‍රමය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑස් නම් ඒ මන්ද?

577/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් මහවැලි ''එල්'' කලාපය සඳහා මුලතිව් හා වවුනියා දිස්ත්‍රික්කවලින් අත්පත් කර ගත් ඉඩම් ප්‍රමාණය කොපමණද යන්න හෙක්ටයාර්වලින් හා ප්‍රතිශතයක් ලෙස එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 1984 වර්ෂයේදී බලහත්කාරයෙන් ඉවත් කරන ලද මුලතිව් දිස්ත්‍රික්කයේ කෝකිලායි, කොක්කුත්තොඩුවායි, කර්නාට්ටුක්කේණි ගම්මානවල ජීවත් වූ, දෙමළ ජනතාව, යුද්ධයෙන් පසු එම ගම්මාන වෙත පදිංචියට ගිය විට ඔවුන්ගේ ඉඩම්වල සිංහල ජනතාව පදිංචිව සිටි බවත්;

(ii) දෙමළ නම්වලින් හැඳින්වූ ගම්මාන හා වැව් සඳහා සිංහල නම් යොදා තිබූ බවත්;

(iii) දෙමළ ජනතාවගේ බලපත්‍ර සහිත ඉඩම්, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් දේශපාලඥයන්ගේ ඥාතීන් හා ධනවතුන්ට දීර්ඝ කාලීන බද්දට ලබාදී තිබූ බවත්;

(iv) ඉහත ගම්මානවල ජනතාව සිය ඉඩම්වල ගොවිතැන් කිරීමේදී, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් බාධා කරන බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) මුලතිව් දිස්ත්‍රික්කයේ මහවැලි "එල්" කලාපයට අයත් සිංහල ජනතාව පදිංචි ඉඩම් හැර ඉතිරි ඉඩම්, මුහුදුබඩපත්තුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත පවරන්නේද;

(ii) නොඑසේ නම්, ඊට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

607/2020

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මේ වනවිට ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව ලබා දෙනු ලබන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම දීමනාව ලබා ගැනීම සඳහා අයදුම් කර දැනට පොරොත්තු ලේඛනයේ සිටින සංඛ්‍යාව කොපමණද;

(iii) රජයේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයට අනුව, ජ්‍යෙෂ්ඨ පුරවැසි දීමනාව රු.2000.00 සිට රු. 2500.00 දක්වා වැඩි කිරීමට ක්‍රියා මාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම වැඩි කරනු ලබන දීමනාව ලබා දෙන දිනය කවරේද;

(v) විදේශ වන්දනා ගමන් සඳහා ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට අඩු පොලියට ණය ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(vi) එසේනම්, එය සම්බන්ධීකරණය කරනු ලබන ආයතන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

726/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) මාතලේ දිස්ත්‍රික්කයේ ලග්ගල, පල්ලේගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ලග්ගල ප්‍රාදේශීය රෝහල අලුතින් ඉදිකිරීම සඳහා රජය විසින් වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) එම රෝහලේ නේවාසිකව ප්‍රතිකාර ලබා ගත හැකි රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(iii) රෝහල සඳහා අනුමත වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) මේ වනවිට එම රෝහලේ සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) රෝහල සඳහා අනුමත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vi) මේ වනවිට එම රෝහලේ සේවයේ නිරත හෙද කාර්ය මණ්ඩලය කොපමණද;

(vii) දැනට එම රෝහලේ පවත්වාගෙන යනු ලබන සායන වර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

770/2020

ගරු මුජිබර් රහුමාන් මහතා,— ගරු අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ දිස්ත්‍රික්කයේ තිබෙන අර්ධ රාජ්‍ය පාසල් සිය අරමුණුවලට පටහැනිව යමින් අසල්වැසි, අඩු පහසුකම් සහිත ළමුන් බඳවානොගන්නා බව එතුමා දන්නෙහිද ?

(ආ) එසේනම්, කොළඹ දිස්ත්‍රික්කයේ එක් එක් අර්ධ රාජ්‍ය පාසැල සම්බන්ධයෙන්,

(i) පාසලේ නම කවරේද;
(ii) ආගමික හෝ ආගමික නොවන ලෙස වර්ගය කවරේද;
(iii) ජාතිය හා ආගම පදනම් කොට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව කොපමණද;
(iv) එක ශ්‍රේණියේ සිට පහ ශ්‍රේණිය දක්වා අනුමත ඉංග්‍රීසි ප්‍රමුඛ කොටගත් ද්විභාෂික පංති සංඛ්‍යාව කොපමණද;
(v) අඩු පහසුකම් සහිත අසල්වැසි ළමුන්ට වෙන්කොට ඇති කෝටාව කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) ඉහත කී පාසැල් සම්බන්ධයෙන්;

(i) පළමු ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් පංති පැවැත්වීමට අවසර ලබාදී තිබේද;
(ii) පළමු ශ්‍රේණියට බඳවාගැනීම පිළිබඳ පොදු මාර්ගෝපදේශ අනුගමනය නොකළ හැක්කේ මන්ද;
(iii) පවත්නා ඇතුලත් කරගැනීමේ ක්‍රියාවලිය, විනිවිදභාවය හා කාර්‍යසාධනය පිළිබඳව රජය සෑහීමට පත්වන්නේද;
(iv) ඉගෙනුම් හා කලමණාකරන ක්‍රමවේද විධිමත් කිරීමට රජය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

838/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 අනුව, රජයේ සියලු විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් සාධාරණ අයුරින් වැඩි වී නොමැති බවත්;
(ii) ඒ හේතුවෙන් විශ්‍රාමිකයන් කළකිරීමට පත් වී ඇති බවත්;
(iii) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදියර පහක් යටතේ වැඩිවන අවසන් වැටුප මත විශ්‍රාම වැටුප් සැකසීමට නියමිතව තිබුණද, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2019 ට අනුව 2017.01.01 දිනට අදාළව අදියර දෙකක් යටතේ වූ වැටුප මත පමණක් විශ්‍රාම වැටුප සැකසීම හේතුවෙන් 2016.01.01 දිනට ප්‍රථම විශ්‍රාම ගන්වනු ලැබූ ත්‍රිවිධ හමුදාවේ හා පොලිසියේ රණවිරුවන් ඇතුළු සියලුම රජයේ විශ්‍රාමිකයන්ට බලවත් අසාධාරණයක් සිදු වී ඇති බවත්;
(iv) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 අනුව අදියර පහක් යටතේ වැඩිවීමට නියමිතව තිබූ අවසන් වැටුප මත විශ්‍රාම වැටුප සැකසීමට කටයුතු කරන ලද්දේ නම්, 2020.01.01 දිනට ප්‍රථම විශ්‍රාම ලබාගත් රජයේ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම වැටුප් විෂමතාවය ඉවත් වීමෙන් ඔවුන්ට සාධාරණයක් ඉටුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 කඩිනමින් ක්‍රියාත්මක කර රජයේ විශ්‍රාමිකයන්ට සාධාරණයක් ඉටු කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2021 ජනවාරි 20 බදාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

22/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2020.08.31 දින වනවිට ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ ලියාපදිංචි වී ඇති මූල්‍ය සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් හා අධ්‍යක්ෂ මණ්ඩලයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පසුගිය යහපාලන රජය බලයට පත් වූ දින සිට 2020.08.31 දින දක්වා මූල්‍ය අර්බුදවලට ලක් වූ මූල්‍ය සමාගම් සංඛ්‍යාව සහ ඒවායේ නම් කවරේද;

(ii) එම එක් එක් මූල්‍ය සමාගමේ තැන්පතු පවත්වාගෙන ගොස් ඇති තැන්පත්කරුවන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම මූල්‍ය සමාගම්වල තැන්පත්කරුවන්ට සාධාරණය ඉටු කිරීම සඳහා මෙතෙක් ගනු ලැබූ සහ ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

66/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) 2015 වර්ෂයේ සිට මේ වන තෙක් දුම්රිය ප්‍රවාහනයට එකතු කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම එක් එක් දුම්රිය මැදිරි අතරින් දේශීයව නිෂ්පාදන කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව හා විදේශීය රටවලින් ආනයනය කරන ලද දුම්රිය මැදිරි සංඛ්‍යාව;

(ii) ඒ සඳහා වැය කරන ලද මුදල;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) අප රට තුළ දුම්රිය මැදිරි නිෂ්පාදනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න එතුමා තවදුරටත් මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

108/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ දරුවන් සඳහා ලබා දෙන ත්‍රිපෝෂ පෝෂණ අතිරේකය ප්‍රමාණවත් හා විධිමත් පරිදි නොලැබෙන බවත්;

(ii) ළමා මන්දපෝෂණය සැලකිය යුතු මට්ටමක පැවතීමට මෙම තත්ත්වයද එක් හේතුවක් බවත්;

(iii) ඒ හේතුවෙන්, දරුවන් සිටින අඩු ආදායම්ලාභී පවුල් දැඩි අපහසුතාවයට පත්වන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) දැනට වාර්ෂික ත්‍රිපෝෂ නිෂ්පාදන ධාරිතාවය කිලෝග්‍රෑම් කොපමණද;

(ii) පරිභෝජනය සඳහා වර්ෂයකට අවශ්‍ය ත්‍රිපෝෂ කිලෝග්‍රෑම් ප්‍රමාණය කොපමණද යන්න ගණනය කර තිබේද;

(iii) එසේ නම්, එම ප්‍රමාණය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) රටේ අවශ්‍යතාවයට ප්‍රමාණවත් පරිදි ත්‍රිපෝෂ නිෂ්පාදනයට පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ කවර ආකාරයෙන්ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

168/2020

ගරු එස්.එම්. මරික්කාර් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) දෙහිවල - ගල්කිස්ස ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙල ක්‍රියාත්මක වන ආකාරය පැහැදිලි කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

190/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) ශ්‍රී ලංකාවේ ඇති ක්‍රිකට් සංගම් සංඛ්‍යාව කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ ඇති පරිපාලන දිස්ත්‍රික්ක 25 සඳහා ක්‍රිකට් සංගම් 25ක් තිබෙන බවත්;

(ii) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා දී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ඇ) (i) කිළිනොච්චි දිස්ත්‍රික්කය සඳහා වූ ක්‍රිකට් සංගමය පිහිටුවීමට මෙතෙක් අනුමතිය ලබා නොදීමට;

(ii) තම ලියාපදිංචිය ඉල්ලා කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය අවස්ථා ගණනාවකදීම අයදුම් කර ඇතත් මෙතෙක් ලියාපදිංචි නොකිරීමට;

හේතු කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) 2010 වර්ෂයෙන් පසුව කිළිනොච්චි දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය සඳහා ක්‍රීඩා අමාත්‍යාංශය විසින් ලබාදී ඇති ආධාර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

228/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ;

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ පලතුරු ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම පලතුරු ආනයනය කළ රටවල්වල නම්;

(iv) එම පලතුරු ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට පලතුරු ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

438/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ තරුණ තරුණියන්ගේ කුසලතා වර්ධනය වෙනුවෙන් ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන පිහිටුවා ඇති බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති ජාතික යොවුන් සේනාංක පුහුණු මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටුවීමේදී දිස්ත්‍රික් පදනම හෝ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පදනම සැලකිල්ලට ගෙන තිබේද;

(iii) එම මධ්‍යස්ථානවලින් පුහුණුව ලබා වාර්ෂිකව පිට වී යන තරුණ තරුණියන් සංඛ්‍යාව දළ වශයෙන් කොපමණද;

(iv) සාර්ථකව පුහුණුව නිම කරනු ලබන තරුණ තරුණියන් රැකියාගත කිරීමේ වැඩපිළිවෙළක් තිබේද;

(v) නොඑසේ නම්, ඔවුන්ගේ අනාගතය සාර්ථක කරන විධිමත් වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

481/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) පුත්තලම දිස්ත්‍රික්කයේ වනාතවිල්ලුව, පරණ එළුවන්කුලම ප්‍රදේශයේ කාලයක් තිස්සේ කැනීම් බලපත්‍ර නොමැතිව නීතිවිරෝධී ලෙස වැලි කැනීමේ ජාවාරම සිදුකරගෙන යන බව එතුමා දන්නෙහිද?

(ආ) මෙම නීති විරෝධී වැලි කැනීම් ජාවාරම මැඩපැවැත්වීමට අමාත්‍යාංශය විසින්,

(i) මෙතෙක් ගෙන ඇති පියවර;

(ii) ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත පියවර;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

547/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හබරාදූව, අක්මීමන, ගාල්ල සහ රත්ගම යන ප්‍රදේශවලට දැඩි පානීය ජල ගැටලුවක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී ප්‍රශ්නයට විසඳුම වන මාගාල්ල ජල යෝජනා ක්‍රමයේ ඊළඟ අදියර සඳහා ඉදිරි අයවැය ලේඛනයෙන් මුදල් වෙන් කරන්නේද;

(ii) එසේ නම්, එම මුදල කොපමණද;

(iii) ඉහත කී ප්‍රදේශවල පවතින පානීය ජල ගැටලුව සඳහා විසඳුමක් ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

558/2020

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් දේවහුව ග්‍රාම නිලධාරි වසම තුළ පිහිටි ගල්බොක්කයාය නම් ගමෙහි, ගලේවෙල-කලා වැව පාරේ, බුලන් වැව ගල් කොරියට හා ප්‍රධාන මාර්ගයට යාබදව ඇති භූමිය, රක්ෂිතයක් බැවින් එය වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් වන බවත්;

(ii) 2020.09.22 වන දින අලුයම් කාලයේදී සංවිධානාත්මක පිරිසක් විසින් ඉහත භූමිය තුළ ස්ථිර ගොඩනැගිල්ලක් හා තාවකාලික ඉදිකිරීම් කීපයක් සිදුකර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ඉදිකිරීම් සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම්වරයාගේ අනුමතිය ලැබී තිබේද;

(ii) නොඑසේ නම්, වෙනත් වගකිව යුතු රාජ්‍ය නිලධාරියකු හෝ ආයතනයක අනුමතිය ලැබී තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) නොඑසේ නම්, මෙම ඉදිකිරීම් ඉවත් කර රක්ෂිතය ආරක්ෂා කර ගැනීමට කඩිනම් ක්‍රියාමාර්ග ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

581/2020

ගරු වේලු කුමාර් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) තෙල්දෙණිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටා ඇති මාබේරිතැන්න රජයේ සත්ව ගොවිපොළ, ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලය (NLDB) විසින් පාලනය කරනු ලබන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගොවිපොළෙහි සේවය කරනු ලබන කාර්යාලීය නිලධාරින් සංඛ්‍යාව සහ කම්කරුවන් සංඛ්‍යාව;

(ii) පදිංචි වී සිටින පවුල් සංඛ්‍යාව;

(iii) පිහිටා ඇති කම්කරු ජනාවාස හා ලයින් සංඛ්‍යාව;

(iv) පිහිටා ඇති මුළු ලයින් කාමර සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ඉහත සඳහන් ගොවිපොළෙහි, ලයින් කාමරවල පදිංචි වී සිටින පවුල් සඳහා තනි නිවාස ඉදිකිරීමට පසුගිය කාලයේදී ඉඩම් ලබා දුන් බව දන්නේද;

(ii) එසේ නම්, ලබා දෙන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව කොපමණද;

(iii) එම ගොවිපොළෙහි පදිංචි වී සිටින එහෙත් ලැයින් කාමරවල පදිංචි වී නොසිටින පවුල් සඳහා ඉඩම් ලබා දීමට කටයුතු කරන්නේද;

(iv) නොඑසේ නම්, එයට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

603/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 308 ග්‍රාම නිලධාරි වසමේ පිහිටි ආසිරිගම මාර්ගයේ කාගොල්ලෑව හන්දියේ සිට කටුකැලියාව හන්දිය දක්වා කිලෝ මීටර් 2 ක පමණ දුර ප්‍රමාණයකින් යුක්ත වූ කොටස ඉතාමත් අබලන් තත්ත්වයේ පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම මාර්ග කොටස අලුත්වැඩියා කිරීමට අවශ්‍ය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

635/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ, පලුකාමම්, වීරච්චේනෙයි, මායාපුරම් සහ වන්නිනගර් යන ගම්මානවල ජීවත්වන ජනතාව පානීය ජල හිඟයකට මුහුණ දී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ගම්මානවල ජීවත්වන, පානීය ජල හිඟයකට මුහුණ දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල ජනතාව පානීය ජලය ලබා දීම සඳහා ජල නල එළිය යුතු දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම ගම්මානවල පවතින පානීය ජල හිඟය විසඳීම සඳහා කඩිනම් පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

727/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) එවකට බලයේ සිටි ජනාධිපතිවරයා විසින් 2013 ජනවාරි මස 15 වන දින අගවිනිසුරු ධුරයට ව්‍යවස්ථානුකූලව පත් කරන ලද මොහාන් පීරිස් මහතාගේ පත්කිරීම, පසුව අවලංගු හා බල ශූන්‍ය කරන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) මොහාන් පීරිස් මහතාගේ අගවිනිසුරු ධුරය සඳහා වූ එම පත්කිරීම, අවලංගු හා බලශූන්‍ය කර ඇත්තේ කවුරුන් විසින්ද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

771/2020

ගරු මුජිබර් රහුමාන් මහතා,— ගරු මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරය සම්බන්ධයෙන් 2019.04.21 සිට සිය ගණනක් පුද්ගලයන් අත්අඩංගුවට ගෙන රඳවාතබා ගෙන සිටින බව එතුමා දන්නෙහිද?

(ආ) 2019.04.21 දින සිට 2019.11.16 දින දක්වා සහ 2019.11.17 සිට මේ දක්වා කාලය තුළ,

(i) විමර්ශන සඳහා භාරයට ගත් සංඛ්‍යාව කොපමණද ;

(ii) රඳවාගැනීම් නියෝගය දීර්ඝ කරමින් රඳවාතබාගෙන සිටින සංඛ්‍යාව කොපමණද ;

(iii) චෝදනා පත්‍ර ගොනුකොට උසාවියට ඉදිරිපත් කළ සංඛ්‍යාව කොපමණද ;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද ?

(ඇ) (i) නිදහස් කොට, ඇප ලබාදී හෝ නිදොස් කොට ඇති පුද්ගලයන්ගේ නම් කවරේද;

(ii) පවතින විමර්ශන ක්‍රියාවලිය පිළිබඳව රජය තෘප්තිමත් වන්නේද;

(iii) සුළු චෝදනා මත රඳවා සිටින පුද්ගලයන් නිදහස් කිරීමටත්, දීර්ඝ කළ රැඳවුම් නියෝග මත සිටින සැකකරුවන් අධිකරණයට ඉදිරිපත් කිරීමටත් රජය පියවර ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නේ ද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජනවාරි 21 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

26/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රැකියා විරහිත උපාධිධාරීන් සම්මුඛ පරීක්ෂණයක් මඟින් රජයේ ආයතනවල අභ්‍යාසලාභී පුහුණුව සඳහා බඳවා ගැනීමට 2020 වර්ෂයේදී ප්‍රසිද්ධ කරන ලද පුවත්පත් දැන්වීමකට අනුව, ඒ සඳහා අයදුම්පත් යොමු කළ උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සම්මුඛ පරීක්ෂණ සඳහා පෙනී සිටි උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) සම්මුඛ පරීක්ෂණයෙන් පසුව පුහුණුව සඳහා බඳවාගන්නා ලද උපාධිධාරීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ පුහුණුව සඳහා බඳවාගැනීමේදී මෙම උපාධිධාරීන් බාහිර හා අභ්‍යන්තර උපාධිධාරීන් වශයෙන් වර්ගීකරණයක් සිදු කර තිබේද;

(ii) එසේ නම්, බඳවාගත් බාහිර උපාධිධාරීන් සංඛ්‍යාව සහ අභ්‍යන්තර උපාධිධාරීන් සංඛ්‍යාව, එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) බාහිර උපාධිධාරීන් සඳහා පත්වීම් ලිපි ලබා දීමේදී ගැටලුකාරී තත්ත්වයක් උද්ගත වීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

130/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන මහ නගර සභා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මහ නගර සභා අතරින් කසළ ඉවත් කිරීම පෞද්ගලික ආයතන වෙත භාර දී ඇති මහ නගර සභාවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මහ නගර සභාවල කසළ ඉවත් කිරීම භාරගත් පෞද්ගලික සමාගම්වල නම් කවරේද;

(ii) 2015 වර්ෂයේ සිට මේ දක්වා ඉහත සමාගම් වෙත ගෙවා ඇති මුදල කොපමණද;

යන්නත් වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) එම පළාත් පාලන ආයතනවල සේවකයන් යොදවා සිය පළාත් පාලන බලප්‍රදේශයේ කසළ ඉවත් කරවීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

169/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ ඉඩම් ඔප්පු හිමිකම් නොමැති නිවාස සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිවාස සඳහා ඔප්පු ලබා දීමේ වැඩපිළිවෙළක් තිබේද;

(iii) එසේ නම්, එම වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

229/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ;

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ කිරි පිටි ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම කිරි පිටි ආනයනය කළ රටවල්වල නම්;

(iv) එම කිරි පිටි ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට කිරි පිටි ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

267/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොත්මලේ පිහිටි වාරිමාර්ග හා ජල කළමනාකරණය පිළිබඳ ජාත්‍යන්තර පුහුණු ආයතනයෙහි පුහුණුව ලද ඉංජිනේරු සහකාර දෙවැනි කණ්ඩායමේ අභ්‍යාසලාභීන් 71 දෙනෙකු මේ වනතෙක් ස්ථිර සේවයට බඳවාගෙන නොමැති බවත්;

(ii) මේ වනවිට ඔවුන්ගේ පුහුණුව අවසන් වී වර්ෂයකට වඩා වැඩි කාලයක් ගත වී ඇති බවත්;

(iii) ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්තව සේවය කළද, ඔවුන්ට නිසි වැටුප් ගෙවීමක් සිදු නොකරන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එම අභ්‍යාසලාභීන් ස්ථිර සේවයට බඳවාගන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

419/2020

ගරු වරුණ ලියනගේ මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) රත්නපුර දිස්ත්‍රික්කයේ වතු ආශ්‍රිතව ජීවත්වන පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ට නිවාස තනා ගැනීම සඳහා ඉඩම් ලබා දී තිබේද;

(iii) එසේ නම්, ඉඩම් ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) එම පවුල්වලට ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය කොපමණද;

(v) එසේ ඉඩම් ලබා දී ඇති පවුල්, අයත්වන වතු සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉඩම් නොමැති වතු ආශ්‍රිතව ජීවත් වන පවුල් සඳහා ඉඩම් ලබාදීමට රජය ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(ii) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

451/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මොරගහකන්ද-කළු ගඟ සංවර්ධන ව්‍යාපෘතිය ආරම්භ කර උතුරු මැද පළාතට ජලය ලබාදීමේ පියවරක් වශයෙන් මේ වනවිට පොළොන්නරුව දිස්ත්‍රික්කයට ජලය ලබාදී ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) ඉහත ව්‍යාපෘතිය යටතේ අනුරාධපුර දිස්ත්‍රික්කයට ජලය ලබාදීම සඳහා ක්‍රියාමාර්ග ආරම්භ කර තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම යෝජනා ක්‍රම මඟින් හුරුළුවැවට හා කණදරාවැවට ජලය ලබාදීමේ යෝජනාවක් තිබේද;

(ii) එසේ නම්, එම යෝජනාව ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

483/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ජාතික කෘෂිකර්ම තොරතුරු හා සන්නිවේදන මධ්‍යස්ථානය විසින් ශ්‍රී ලංකාවේ වගා බිම්වල පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතය පිළිබඳ පර්යේෂණයක් සිදු කර තිබෙන බවත්;

(ii) පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතා කර වගා කරන රටවල් අතරින් ශ්‍රී ලංකාව ඉදිරියෙන් සිටින රටක් බවට පත්ව තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) පළිබෝධ නාශක, වල් නාශක සහ පොහොර භාවිතා කර වගා කටයුතු සිදුකිරීම අවම කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

544/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නායයාමේ අවදානම් සහිත දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී ඊට අවසර ලබාගත යුතු ආයතන කවරේද;

(ii) එම ආයතන මඟින් ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවසර ලබා දෙන ක්‍රමවේදය කවරේද;

(iii) එම ක්‍රමවේදයන් අනුවම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා අවසර ලබාදීම සිදුවන්නේද;

(iv) නොඑසේ නම්, ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ගය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නායයාමේ අවදානම් නොමැති දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී අදාළ පළාත් පාලන ආයතනවලින් පමණක් අනුමතිය ලබාදෙන බව එතුමා දන්නේද;

(ii) එම දිස්ත්‍රික්ක තුළ ගොඩනැගිලි ඉදිකිරීමේදී ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයෙන් සහ භූවිද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයෙන් අධීක්ෂණයක් සිදුවන්නේද;

(iii) අධීක්ෂණයක් සිදු වන්නේ නම්, ගොඩනැගිලි වර්ග කිරීමක් කර අනුමතිය ලබාදෙන්නේද;

(iv) නොඑසේ නම්, ඉදිරියේදී එවැනි වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

636/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කය තුළ පිහිටා ඇති දෙමළ ජාතික නියෝජිතයන් බහුතරයක් සිටින ප්‍රාදේශීය සභා, නගර සභා ලෙස උත්ශ්‍රේණිගත කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

639/2020

ගරු රවුෆ් හකීම් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වන සංරක්ෂණ ආඥා පනත අනුව යම් භූමියක් සංරක්ෂිත වනාන්තරයක් ලෙස ගැසට් නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කිරීමට සම්පූර්ණ විය යුතු මූලික අවශ්‍යතා කවරේද;

(ii) වන සංරක්ෂණ ආඥාපනත යටතේ මේ දක්වා ප්‍රකාශයට පත්කර ඇති රක්ෂිත වනාන්තර සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම එක් එක් වනාන්තරය, රක්ෂිත වනාන්තරයක් ලෙස ප්‍රකාශයට පත්කළ දිනය, එයට අයත් වන භූමි ප්‍රමාණය හා අදාළ සිතියම් පිළිබඳ සියලු විස්තර දිස්ත්‍රික් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

729/2020

ගරු ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල සිට ගලේවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය හරහා දඹුල්ල දක්වා දුම්රිය මාර්ගයක් ඉදිකිරීමට සැලසුම් කර තිබෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, ඒ සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණය කොපමණද;

(ii) එම ව්‍යාපෘතියේ වැඩ ආරම්භ කිරීමට නියමිත දිනය කවරේද;

(iii) එම ව්‍යාපෘතියේ වැඩ අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

777/2020

ගරු අශෝක් අබේසිංහ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුළ පදිංචිව සිටින ඉඩම් ඔප්පු හිමිකම් නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් සඳහා ඔප්පු ලබාදීමේ ක්‍රමවේදයන් සකස් කර තිබේද;

(iii) එසේ නම්, එම ක්‍රමවේදයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

839/2020

ගරු ජේ.සී. අලවතුවල මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මේ වනවිට විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් අතරින් කොවිඩ්-19 වෛරසය,—

(i) ආසාදනය වූ;

(ii) ආසාදනයෙන් පසුව සුව වූ;

(iii) ආසාදනයෙන් පසු මරණයට පත් වූ;

(iv) හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකාවට පැමිණි;

ශ්‍රමිකයන් සංඛ්‍යාව ඔවුන් සේවය කරන රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත වෛරසය ආසාදනය හේතුවෙන් මේ වනවිට රැකියා අහිමි වූ විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සංඛ්‍යාව ඔවුන් සේවය කළ රට අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ඔවුන්ට සහන සැලසීමට ගත් ක්‍රියාමාර්ග කවරේද;

(iii) කොවිඩ්-19 ගෝලීය වසංගත තත්ත්වයට ගොදුරු වූ විදෙස්ගත ශ්‍රමිකයන් තම පවුල්වලට මුදල් නොඑවීමෙන් ආර්ථික අපහසුතාවයට පත් පවුල්වලට සහන සැලසීමට ගත් පියවර කවරේද;

(iv) එම වසංගතය හේතුවෙන් විපතට පත් විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ සුභසාධනය සඳහා අදාළ රටවල තානාපති කාර්යාලවලට ලබා දුන් ප්‍රතිපාදන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

877/2020

ගරු එරාන් වික්‍රමරත්න මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය සීමාවන් ඉක්මවා යමින් ණය නිකුත් කිරීමට පෙර නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලද්දේ ද;

(ii) එසේනම්, නීතිපතිවරයාගේ උපදෙස් මත ගන්නා ලද ක්‍රියාමාර්ග කවරේද;

(iii) 2020 වර්ෂයේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාමය සහ නීතිමය වශයෙන් නියම කර ඇති ණය ගැනීමේ සීමාව ඉක්මවා යමින් නිකුත් කරන ලද ණය ශ්‍රී ලංකා රජය විසින් නිකුත් කරන ලද අනිකුත් ණය හා සමාන ලෙස ගෙවීම් පැහැර හැරීම පිළිබඳ සිදුවීම්කදී සලකනු ලැබේ ද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ආ) (i) 2020 අංක 1 දරන ජාතික අයවැය චක්‍රලේඛය සම්බන්ධයෙන් නීතිපතිවරයාගේ උපදෙස් ඉල්ලා සිටින ලද්දේ ද;

(ii) එසේනම්, නීතිපතිවරයාගේ උපදෙස් මත ක්‍රියාමාර්ග ගන්නා ලද්දේ ද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 ජනවාරි 22 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

27/2020

ගරු හේෂා විතානගේ මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ ඉදිකිරීම් සඳහා වැය කරන ලද මුදල කොපමණද;

(ii) එම මුදල් සපයාගත් මූලාශ්‍ර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) මත්තල ජාත්‍යන්තර ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මේ දක්වා;

(i) ලැබූ ආදායම;

(ii) නඩත්තු කටයුතු වෙනුවෙන් දරන ලද වියදම;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ගුවන්තොටුපොළ විවෘත කළ දින සිට මෙතෙක් එහි පැමිණි ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගුවන් යානා අයත් වන ගුවන් සේවා ආයතනවල නම් කවරේද;

(iii) එම කාලසීමාව තුළ මෙම ගුවන්තොටුපොළ හරහා ගමන් ගත් මගීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) මෙම ගුවන්තොටුපොළ තවදුරටත් සංවර්ධනය සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

135/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදේශ රටවල්වල පිහිටි ශ්‍රී ලංකාවේ විදේශ ගත රාජ්‍ය දූත මණ්ඩල සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් දූත මණ්ඩල පිහිටි රටවල් හා නගර වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම එක් එක් දූත මණ්ඩලයේ සේවය කරන සේවක සංඛ්‍යාව සහ තනතුරු නාම වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම සේවකයන් අතරින් සෘජුවම ශ්‍රී ලංකා විදේශ සේවයට බඳවාගැනීමේ විභාගයෙන් සමත් වූ නිලධාරීන් සංඛ්‍යා සහ ඔවුන්ගේ නම් කවරේද;

(v) ශ්‍රී ලංකා විදේශ සේවයට සෘජුවම අයත් වන සේවක සංඛ්‍යාව, විදේශ දූත මණ්ඩලවල සේවය කරන සමස්ත සේවක සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස කවරේද;

(vi) විදේශ දූත මණ්ඩලවල සේවය සඳහා ශ්‍රී ලංකා විදේශ සේවයට අයත් නිලධාරීන් වැඩි වශයෙන් බඳවාගැනීමට අමාත්‍යාංශය ඉදිරියේදී ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

191/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) කිළිනොච්චි නගර මධ්‍යයේ පිහිටා ඇති පොදු ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක් ලෙස සංවර්ධනය කිරීමට 2010 වර්ෂයේදී ඉදිකිරීම් කටයුතු ආරම්භ කර මේ වනවිට දස වසරක් ගත වී තිබුණ ද, එම ක්‍රීඩාංගණය දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ප්‍රයෝජනය සඳහා මේ දක්වා භාර දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ක්‍රීඩාංගණය, ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩාංගණයක්ද; නොඑසේ නම්, දිස්ත්‍රික් මට්ටමේ ක්‍රීඩාංගණයක්ද;

(ii) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් කටයුතු සඳහා වෙන් කරන ලද මුදල කොපමණද;

(iii) ඉහත මුදලින් පසුගිය වර්ෂ 10 තුළදී වැය කර ඇති මුදල කොපමණද;

(iv) ක්‍රීඩාංගණයේ ඉදිකිරීම් වෙනුවෙන් කොන්ත්‍රාත් අත්සන් කර ඇති කොන්ත්‍රාත්කරුවන් සංඛ්‍යාව කොපමණද;

(v) කොන්ත්‍රාත් කටයුතු සිදු කරන වර්තමාන කොන්ත්‍රාත්කරුගේ නම කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ක්‍රීඩාංගණයේ ප්‍රතිසංස්කරණ කටයුතුවල ප්‍රමාදය, දිස්ත්‍රික්කයේ ක්‍රීඩකයන්ගේ ක්‍රීඩා කටයුතුවලට කෙතරම් දුරට බලපා තිබේද;

(ii) දිස්ත්‍රික්කයේ ක්‍රීඩා ක්ෂේත්‍රය නංවාලීමට අමාත්‍යාංශය විසින් ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

230/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂයක් තුළ;

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ දැව ප්‍රමාණය;

(ii) ඒ සඳහා වැය වූ මුදල;

(iii) එම දැව ආනයනය කළ රටවල්වල නම්;

(iv) එම දැව ආනයනය කළ සමාගම්වල නම්;

කවරේද යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට දැව ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

317/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මලල ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ මලල ක්‍රීඩා හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මලල ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා මලල ක්‍රීඩා සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

453/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, කහටගස්දිගිලිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 215 දිවුල්වැව ග්‍රාම නිලධාරි වසමේ, බඹරඇල ග්‍රාමයේ 1973 වර්ෂයේ සිට හේන් ගොවිතැන් කරන ලද ගොවීන්ගේ සින්නක්කර ඔප්පු සහිත ඉඩම්වලට වනජීවී නිලධාරීන් පැමිණ රක්ෂිත මායිම් සළකුණු කර මායිම් කණු දමා ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන පියවර කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

485/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩලය ස්ථාපිත කළ දිනය කවරේද;

(ii) එය ස්ථාපිත කිරීමේ අරමුණු කවරේද;

(iii) 2015 වර්ෂයේ සිට මෙ වනතෙක් වී අලෙවි මණ්ඩලය විසින් එක් එක් කන්නයේ මිලදී ගත් වී ප්‍රමාණය කොපමණද;

(iv) පෞද්ගලික අංශයේ වෙළඳුන් විසින් ගොවීන්ගෙන් අඩු මිලට වී මිලදී ගැනීම වැළැක්වීම සඳහා වී අලෙවි මණ්ඩලය ශක්තිමත් කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

528/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති උතුරු මැද පළාත් සභාවට අයත් පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල්වල නම් කවරේද;

(iii) එම පාසල්වල දැනට පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව කොපමණද;

(iv) එම ගුරු පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් විෂයය අනුව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ගුරු පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

560/2020

ගරු මයන්ත දිසානායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට රජය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථාන පිහිටි ප්‍රදේශ කවරේද;

(iii) පෞද්ගලික අංශය මඟින් පවත්වාගෙන යනු ලබන වී ගබඩා මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(iv) එම එක් එක් වී ගබඩා මධ්‍යස්ථානය තුළ මේ වනවිට ගබඩා කර තිබෙන වී ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) මෙම ගබඩාවලට අමතරව නව වී ගබඩා මධ්‍යස්ථාන ආරම්භ කිරිමට සැලසුම් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මේ වනවිට ගොවීන් සඳහා නොමිලේ පොහොර ලබා දෙන්නේද;

(ii) එසේ නම්, එක් ගොවියෙකු සඳහා ලබා දෙන පොහොර ප්‍රමාණය කොපමණද;

(iii) එසේ නොමිලේ ලබා දෙන පොහොර වර්ග කවරේද;

(iv) ඒ සඳහා රජය විසින් වැය කරන මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

590/2020

ගරු එස්.එම්.එම්.මුෂාරෆ් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පිහිටා ඇති සුප්‍රසිද්ධ සංචාරක කලාපයක් වන අරුගම්බේ වෙරළ ප්‍රදේශය, මුහුදු රළ මත ලිස්සා යෑමේ ක්‍රීඩාව සඳහා ලෝකයේ පවතින මුල් ස්ථාන 10 අතරට අයත් වන බව දන්නේද;

(ii) එසේ නම්, අරුගම්බේ ප්‍රදේශය මේ වනතෙක් සංචාරක කලාපයක් බවට ප්‍රකාශයට පත් නොකිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) සංචාරකයන් විශාල පිරිසක් පැමිණෙන ස්ථානයක් වූ අරුගම්බේ ප්‍රදේශයේ සංචාරකයන් සඳහා අවශ්‍ය යටිතල පහසුකම් ප්‍රමාණවත් පරිදි නොමැති බව දන්නේද;

(ii) එසේ නම්, සංචාරකයන් සඳහා ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් සැපයීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

610/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) කුලියාපිටිය මූලික රෝහල, ශික්ෂණ රෝහලක් බවට පත් කර ඇති බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) එම රෝහල ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ, වෛද්‍ය පීඨයේ සායනික පුහුණුවීම් සඳහා යොදාගැනීමට කටයුතු කරන්නේද;

(ii) මේ සම්බන්ධව කරුණු අධ්‍යයනය කිරීම සඳහා ත්‍රිපුද්ගල කමිටුවක් පත්කර ඇති බව දන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය හා කුලියාපිටිය ශික්ෂණ රෝහල සම්බන්ධව මහාචාර්ය ඒකකයක් පිහිටුවා තිබේද;

(ii) එම ඒකකය කුලියාපිටිය රෝහලේ ස්ථාපනය කිරීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

642/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) උතුරු මැද පළාතේ පිහිටි පහළ මල්වතුඔය ජලාශය ඉදිකිරීම සඳහා හිටපු අග්‍රාමාත්‍යවරයා විසින් මුල්ගල තබන ලද බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය කවරේද;

(ii) එහි ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

(iii) වාරිමාර්ග දෙපාර්තමේන්තුව, චීන සමාගම යන ආයතන දෙක අතරින් මෙම ව්‍යාපෘතියේ ඉදිකිරීම් සිදු කරනු ලබන ආයතනය කවරේද;

(iv) ඉදිකිරීම් කටයුතු චීන සමාගම විසින් සිදු කරනු ලබන්නේ නම්, ඒ සඳහා ඇස්තමේන්තුගත පිරිවැය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

722/2020

ගරු වාල්ස් නිර්මලනාදන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) දිස්ත්‍රික්කයේ ජනතාවට සෞඛ්‍ය සේවා සපයන මන්නාරම දිස්ත්‍රික් රෝහලේ බාහිර රෝගී අංශයේ ගොඩනැගිල්ල ඉතා පැරණි බවත්;

(ii) එම රෝහලේ බාහිර රෝගී අංශය සහ දැඩි සත්කාර ඒකකය ඉදිකරන බවට පසු ගිය කාලයේදී පොරොන්දු වුවද, මේ වනතෙක් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කර නොමැති බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) එම ඉදිකිරීම් කටයුතු ආරම්භ කරන දිනය කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බොහෝ වෛද්‍ය පරීක්ෂණ එම රෝහලේ සිදු නොකරන බවත්;

(ii) සී.ටී. ස්කෑන් (CT SCAN), ස්නායුවේද (NEUROLOGY), උගුර - කණ - නාසය (ENT), විකලාංග (ORTHOPAEDIC), නියෝප්ලස්මාවේදය (ONCOLOGY), මෛත්‍රික රෝග චිකිත්සාව (UROLOGY), වෘක්කවේදය (NEPROLOGY), වක්ත්‍ර, මුඛ හා හණුකවේදය (OMF) යන ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මෙම රෝහලේදී සිදු කිරීමට නොහැකි තත්ත්වයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ඈ) ඉහත ක්ෂේත්‍රයන්ට අදාළ පරීක්ෂණ මන්නාරම දිස්ත්‍රික් රෝහල තුළ සිදු කිරීම, නැවත ආරම්භ කළ හැකිද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

732/2020

ගරු කේ.පී.එස්. කුමාරසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) විදේශ රටකට භාණ්ඩ අලෙවිය සඳහා ඇති පහසුම ක්‍රමය ‘‘ඊ-කොමර්ස්’’ (E-Commerce) වෙබ් අඩවියක් හරහා අලෙවිය වන බැවින් මේ සඳහා ලෝකයේ මිලියන 305ක පමණ ජනතාවක් ‘‘පේපැල්’’ (PayPal) ‘‘ගේට්වේ’’ (Gateway) භාවිතා කරන බවත්;

(ii) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන විදේශයන්ට අලෙවියට ඉහත ක්‍රමය භාවිතා කළ හැකි බවත්;

(iii) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම ක්‍රමය ශ්‍රී ලංකාවේ විවෘත කර නොතිබීමෙන් භාණ්ඩයක්/සේවාවක් විදේශයන්ට අළෙවි කර, විදේශ විනිමය ලැබිය හැකි ආදායම් මාර්ග ඇහිරී ඇති බවත්;

(iv) ශ්‍රී ලංකාවේ ඇති ‘‘ඔන්ලයින්’’ (Online) ක්‍රමයට සේවා සපයන ආයතන, විදේශයන්වල ලිපිනයන් භාවිතා කරමින්‘‘පේපැල්’’ (PayPal) ගිණුම් සකස් කරන බවත්;

(v) මේ හේතුවෙන් ශ්‍රී ලංකාවට ලැබිය යුතු විශාල මුදලක්, කොමිස් වශයෙන් විදේශයන්ට ගෙවීමට සිදුව ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවේ නිෂ්පාදන/සේවාවන් ‘‘ඔන්ලයින්’’ (Online) ක්‍රමයට විදේශයන්ට අලෙවි කිරීම සඳහා පවතින බාධාවන් ඉවත් කිරීමට පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

773/2020

ගරු සුජිත් සංජය පෙරේරා මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන ජාත්‍යාන්තර පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) ජාත්‍යන්තර පාසල් පිහිටුවීමේදී, ගුරුවරුන් බඳවාගැනීමේදී, ගාස්තු අයකිරීමේදී සහ වෙනත් කටයුතුවලදී එකී පාසල් නියාමනය කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 පෙබරවාරි 09 අඟහරුවාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

28/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 වර්ෂයේදී රත්නපුර දිස්ත්‍රික්කය තුළ හඳුනාගත් ඩෙංගු රෝගීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව, එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) රත්නපුර දිස්ත්‍රික්කය තුළ ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා දැනට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

136/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— විදුලිබල අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට මේ වනතෙක් ශ්‍රී ලංකාව පුරා සිදු වූ විදුලිය බිඳ වැටීම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම විදුලිය බිඳ වැටීම් සිදු වූ දිනයන් කවරේද;

(iii) එම විදුලිය බිඳ වැටීම්වලින් පසුව පත් කරන ලද කමිටු සංඛ්‍යාව කොපමණද;

(iv) එම කමිටු මගින් ලබාදෙන ලද නිර්දේශ කවරේද;

(v) ශ්‍රී ලංකාවට පැය 24 පුරාම අඛණ්ඩව විදුලිය ලබා දීමට අමාත්‍යාංශය සතු වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

231/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සත්ව මේද /එළවළු තෙල් ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සත්ව මේද /එළවළු තෙල් ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සත්ව මේද /එළවළු තෙල් ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සත්ව මේද /එළවළු තෙල් ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

318/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ පාපන්දු ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ පාපන්දු ක්‍රීඩා කුසලතාවයන් වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පාපන්දු ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා පාපන්දු සම්මේලනය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

530/2020

ගරු රෝහණ බංඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති උතුරු මැද පළාත් සභාව යටතේ පාලනය වන රෝහල් හා වෛද්‍ය මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල නම් කවරේද;

(iii) ඉහත එක් එක් රෝහල සඳහා අනුමත වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම එක් එක් රෝහලේ මේ වනවිට සේවයේ නියුතු වෛද්‍ය නිලධාරීන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අනුරාධපුර දිස්ත්‍රික්කයේ රෝහල්වල පවතින වෛද්‍ය නිලධාරීන්ගේ හිඟය නැති කිරීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

563/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ශ්‍රී ලංකාවේ පවතින අලි මිනිස් ගැටුම හේතුවෙන් මිනිස් ජීවිත හා දේපළ විනාශ වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) වන අලි පහරදීමෙන් 2019 වර්ෂයේ සිදු වූ මිනිස් මරණ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එක් මිනිස් ජීවිත හානියක් වෙනුවෙන් වර්තමානයේදී ගෙවන වන්දි මුදල කොපමණද;

(iii) 2019 වර්ෂය තුළ දේපළ හානි වෙනුවෙන් ගෙවා ඇති මුළු වන්දි මුදල කොපමණද;

(iv) වන අලි තර්ජනයෙන් ජනතාව මුදවා ගැනීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

582/2020

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය සතු වතු ප්‍රතිසංස්කරණයක් 1992 වර්ෂයේදී සිදුකළ බවත්;

(ii) ඒ අවස්ථාවේදී ප්‍රාදේශීය වතු සමාගම් 22කට රජයේ වතු බද්දට ලබා දී ඇති බවත්;

(iii) එම සමාගම්වලින් බොහෝමයක් වර්තමානයේදී තම බදු අයිතිය වෙනත් ආයතනවලට පවරා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1992 වර්ෂයේදී රජයේ වතු බද්දට ගන්නා ලද වතු සමාගම්වල නම් කවරේද;

(ii) වතු බද්දට ගන්නා ලද මුල් සමාගම්වලින් බදු අයිතිය ලබා ගෙන වර්තමානයේ වතු කළමනාකරණය කරනු ලබන සමාගම්වල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රාථමික බදුකරුට ඔවුන් ලබාගත් රජයේ වතු, වෙනත් ආයතනයකට බදු දීම සඳහා නීතිමය විධිවිධාන තිබේද;

(ii) එසේ නම්, එම නීතිමය විධිවිධාන කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

596/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, කයිට්ස් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අනලයිතීවු දූපතේ පිහිටා ඇති එකම රෝහල වන අනලයිතීවු රෝහලේ අනුමත කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර කවරේද;

(ii) මේ වනතෙක් එම රෝහලට ස්ථිර වෛද්‍යවරයෙක් පත්නොකිරීමට හේතු කවරේද;

(iii) වෛද්‍යවරයෙක් පත්නොකිරීම හේතුවෙන් අනලයිතීවු දූපතේ ජීවත්වන ජනතාව මුහුණදෙන දුෂ්කරතා කවරේද;

(iv) එම ජනතාවට ප්‍රශස්ථ වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා අනලයිතීවූ රෝහලේ පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු සම්පූර්ණ කරන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

604/2020

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ, මහඉලුප්පල්ලම පිහිටි ක්ෂේත්‍ර බෝග පර්යේෂණ හා සංවර්ධන ආයතනයට අයත් වන සම්පූර්ණ භූමි ප්‍රමාණය;

(ii) ඒ අතරින් බීජ නිෂ්පාදන මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iii) ක්ෂේත්‍ර පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(iv) ගොවිපොළ යාන්ත්‍රික මධ්‍යස්ථානය සඳහා වෙන් කර ඇති භූමි ප්‍රමාණය;

(v) වගා කටයුතුවලට යොදා නොගන්නා භූමි ප්‍රමාණය;

අක්කරවලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) වගා කටයුතු සඳහා යොදා නොගන්නා භූමි ප්‍රමාණය වගා කටයුතු සඳහා යොදා ගැනීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

637/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති වැව්වලට අදාළව ව්‍යාපෘති හා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ සැලසුම් පසුගිය කාලවකවානුවේදී ඉදිරිපත් කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මෙම වැව් ප්‍රතිසංස්කරණය කරනු ලබන කාල වකවානු කවරේද;

(ii) 2020 වර්ෂය තුළදී ප්‍රතිසංස්කරණය කිරීම සඳහා තෝරා ගෙන ඇති වැව් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

654/2020

ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) අදාළ දිස්ත්‍රික් ලේකම්වරයාගේ අනුමතිය මත වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයිති ඉඩම්වල හේන් වගාකිරීම සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් රජය තීරණයක් ගෙන තිබේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එසේ නම්, එම තීරණය මගින් ආවරණය වන වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සහ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩම් ප්‍රමාණය;

(ii) ඉහත ඉඩම් ප්‍රමාණය අතුරින් හේන් වගා කිරීම සඳහා අවසර ලබා දී ඇති ඉඩම් ප්‍රමාණය;

(iii) මෙම තීරණය හේතුවෙන් එළිපෙහෙළි කරන අවශේෂ වන ඉඩම් ප්‍රමාණය;

හෙක්ටයාර්වලින් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

758/2020

ගරු අමරකීර්ති අතුකෝරළ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි සුළු වාරිමාර්ග යටතට ගැනෙන වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) එම වැව් හා අමුණු පිහිටා ඇති ප්‍රදේශවල නම් කවරේද;

(iii) ඒ අතරින් වැඩිම වැව් හා අමුණු සංඛ්‍යාවක් පිහිටා ඇති ප්‍රදේශය කවරේද;

(iv) ඉහත වැව් හා අමුණුවල ජල ධාරිතාවය වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට මේ වනතෙක් අලුත්වැඩියා කරන ලද දිස්ත්‍රික්කයේ පිහිටි එවැනි වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(ii) අලුත්වැඩියා කළ යුතු බවට හඳුනාගෙන ඇති වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iii) ඒ අතරින් 2020 වර්ෂය තුළදී අලුත්වැඩියා කරනු ලබන වැව් හා අමුණු සංඛ්‍යාව කොපමණද;

(iv) ඒවායේ නම් කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

847/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2016 වර්ෂයෙන් පසුව ශ්‍රී ලංකාවේ සිදු වූ ස්වභාවික විපත් හේතුවෙන් ආපදාවට පත් වූ පවුල් සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ අතරින් රජය මඟින් ලබා දෙනු ලබන ආපදා වන්දි ලබා දී ඇති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ ආපදා වන්දි ලබා දී නොමැති පවුල් සංඛ්‍යාව කොපමණද;

(iv) ආපදා වන්දි ලබා දී නොමැති පවුල් සඳහා ආපදා වන්දි ලබාදීමට තවදුරටත් ගත වන කාලය කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

853/2020

ගරු අජිත් රාජපක්ෂ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට සිටින ෆීල්ඩ් මාෂල් තනතුර දරන පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඔවුන්ගේ නම් සහ ඔවුන් විශ්‍රාම යාමට නියමිත දින වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත එක් එක් ෆීල්ඩ් මාෂල්වරයාට ගෙවනු ලබන වැටුප් හා දීමනා, ලබා දී ඇති කාර්ය මණ්ඩල සාමාජිකයන් සංඛ්‍යාව, නිල වාහන සංඛ්‍යාව, නිල නිවාස සහ වෙනත් ප්‍රදානයන් වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

939/2020

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුස්ලිම් ආගමික හා සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සුභසාධක සංගම් පවතින බවත්;

(ii) එසේ ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සුභසාධක සංගම්වල ලියාපදිංචිය අහෝසි කළ බව දන්වා එම දෙපාර්තමේන්තුව විසින් අදාළ සංගම්වලට ලිපි යොමු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) නිලවශයෙන් ලියාපදිංචි කරන ලද ස්වේච්ඡා සුභසාධක සංගම්වල ලියාපදිංචිය අහෝසි කිරීමේ පදනම කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2021 පෙබරවාරි 10 බදාදා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

29/2020

ගරු හේෂා විතානගේ මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 70 සම්පූර්ණ කරන ලද ජ්‍යෙෂ්ඨ පුරවැසියන් වෙත ගෙවනු ලබන මාසික දීමනාව රු.2000/- ක් බවත්;

(ii) එසේ ගෙවනු ලබන දීමනාවෙන් රු.100/-ක් 2016 ජනවාරි මාසයේ සිට නොගෙවා රඳවාගන්නා බවත්;

(iii) මෙලෙස මුදල් රඳවාගැනීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ පුරවැසියන් විරෝධය දක්වන බවත්;

(iv) මෙලෙස රඳවාගන්නා මුදල, සමාජ ආරක්ෂණ අරමුදල නමින් ගිණුමක තැන්පත් කරන බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) (i) මේ වන තෙක් එසේ රඳවාගෙන ඇති මුළු මුදල කොපමණද;

(ii) එසේ රඳවාගෙන ඇති මුදල් යොදා ගනිමින් ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ගේ යහපත පිණිස ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) එසේ රු.100/- බැගින් රඳවාගැනීම අත්හිටුවීමට පියවර ගන්නේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

138/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට නිල රාජකාරි කටයුතු සඳහා විදේශගතව සිටින ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයට අයත් නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, තනතුරු නාමය හා රැකියා කරන ස්ථානය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම නිලධාරීන්ට සහ ඔවුන්ගේ පවුල්වලට ගෙවන වැටුප් හා වෙනත් දීමනා කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වර්තමානයේ මතුවී ඇති කොවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ ඉහත සඳහන් නිලධාරින් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමට අමාත්‍යාංශය මෙතෙක් ගත් හා ඉදිරියේදී ගැනීමට අපේක්ෂිත ක්‍රියාමාර්ග කවරේද යන්න වැඩිදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

170/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— ප්‍රවාහන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මාලබේ සිට කොළඹ-කොටුව දක්වා සැහැල්ලු විදුලි දුම්රිය ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කිරීමට යෝජනා වී තිබූ බවත්;

(ii) එම ව්‍යාපෘතිය සඳහා පාංශු පරීක්ෂාව හා ඉඩම් අත්කර ගැනීමට අදාළ මැනුම් කටයුතු සිදු කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය තවදුරටත් ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේනම්, මෙම ව්‍යාපෘතිය සම්බන්ධව ගැනීමට අපේක්ෂිත ඉදිරි පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්,ඒ මන්ද?

232/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ සත්ව ආහාර ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම සත්ව ආහාර ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම සත්ව ආහාර ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට සත්ව ආහාර ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

319/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රග්බි ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ රග්බි ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රග්බි ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා රග්බි පාලක මණ්ඩලය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

549/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— කම්කරු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගාල්ල, ගිංතොට පිහිටා ඇති ගිංතොට ප්ලයිවුඩ් කර්මාන්තශාලාවේ (පෙර ගිංතොට තුනීලැලි කර්මාන්ත ශාලාව) සේවයේ නියුතු සේවක/සේවිකාවන්ට හිමි වැටුප්, දීමනා, පාරිතෝෂික දීමනා සහ වන්දි ගෙවීම් නිසියාකාරව සිදු නොවන බවත්;

(ii) මේ සම්බන්ධව අධිකරණයේ නඩු පවරා ඇති බවත්;

(iii) අධිකරණය මගින් අදාළ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව වරෙන්තු නිකුත් කර ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) එකී වරෙන්තු අනුව අදාළ අධ්‍යක්ෂවරුන්ට එරෙහිව කටයුතු නොකිරීමට හේතු කවරේද;

(ii) ඉහත සේවක/සේවිකාවන්ට හිමි වැටුප්, දීමනා, පාරිතෝෂික දීමනා සහ වන්දි ලබා දීමට පියවර ගන්නා දින වකවානු කවරේද;

(iii) නොඑසේ නම්, අදාළ නිලධාරින්ට එරෙහිව නීතිමය පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

848/2020

ගරු වරුණ ලියනගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික අයවැය චක්‍රලේඛ 03/2016 අනුව ස්ථාපිත ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ස්වභාවික ආපදා අවස්ථාවලදී වන්දි ලබාදීමේ වැඩසටහන මේ වනවිට ක්‍රියාත්මක වන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එකී රක්ෂණභාර අරමුදල මගින් ආපදා අවස්ථාවලදී රක්ෂිත ප්‍රදේශවල සහ අනවසර ඉඩම්වල පදිංචිකරුවන් සඳහාද වන්දි මුදල් ලබා දුන් බවත්;

(ii) එසේ වුවද, අංක 01/2020 දරන ආපදා කළමනාකරණ මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 (iii) ඡේදය යටතේ, දේපල අයිතිය සනාථ කෙරෙන ඔප්පු පිටපත් හෝ වෙනත් ලියවිලි අවශ්‍ය බවට නිර්දේශ කර ඇති බවත්;

(iii) මේ හේතුවෙන් රජය සතු රක්ෂිත, මාර්ග රක්ෂිත, දුම්රිය මාර්ග රක්ෂිත, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සහ රජය සතු වතු වැනි ඉඩම්වල අනවසරයෙන් පදිංචිව සිටින පුද්ගලයන්ට අසාධාරණයක් සිදු වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) (i) ඉහත (ආ) (iii) හි සඳහන් පුද්ගලයන්ට සහන සැලසීම කෙරෙහි රජයේ අවධානය යොමු වී තිබේද;

(ii) එසේ නම්, එම සහන සලසන ආකාරය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

854/2020

ගරු අජිත් රාජපක්ෂ මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ 05, කිරිමණ්ඩල මාවත යන ලිපිනයේ පවත්වාගෙන යනු ලබන සී/ස ආසිරි ශල්‍ය රෝහල පිහිටි ඉඩම, එම රෝහල ඉදිකිරීමට ප්‍රථම රජය සතුව පැවති ඉඩමක් බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දුන් පදනම කවරේද;

(ii) එම ඉඩම, ඉහත සඳහන් රෝහල ඉදිකිරීම සඳහා පවරා දීමේදී, එළැඹී ගිවිසුමේ සහතික කළ පිටපතක් මෙම සභාවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 පෙබරවාරි 11 බ්‍රහස්පතින්දා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

31/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2005 සිට 2020 දක්වා ශ්‍රී ලංකාවේ අලුතින් ආරම්භ කරන ලද විදේශ ආයෝජන සහිත කර්මාන්ත සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කර්මාන්ත ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් නොමැති බවත්;

(ii) පවතින සමහර නීතිරීති හේතුවෙන් ආයෝජකයන් අධෛර්යමත් වන බවත්;

එතුමා පිළිගන්නෙහිද;

(ඇ) ආයෝජකයන් සඳහා ඉතා කඩිනම් සේවාවක් සැපයීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

139/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබා දීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද;

(ආ) (i) රැකියා විරහිත උපාධිධාරීන්ට රැකියා ලබාදීම සම්බන්ධයෙන් අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග;

(ii) එම වැඩසටහන යටතේ මේ වනතෙක් රැකියා ලබා දී ඇති උපාධිධාරීන්ගේ නම්;

(iii) ඔවුන්ගේ සේවා ස්ථාන;

(iv) ඔවුන්ගේ රාජකාරිවල ස්වභාවය;

කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

172/2020

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) මැද-කොළඹ රෝහලේ බාහිර රෝගී අංශයෙන් ප්‍රතිකාර ලබා ගැනීමට දෛනිකව විශාල රෝගීන් පිරිසක් පැමිණියද, මෙම රෝහලේ නේවාසික ප්‍රතිකාර සඳහා අවශ්‍ය වාට්ටු සංකීර්ණ පැවතියද, නේවාසික ප්‍රතිකාර සඳහා යොමුවන පිරිස ඉතාමත්ම අවම ප්‍රමාණයක් වන අතර රෝහල අවට ප්‍රදේශයේම පදිංචිකරුවන් වුවද නේවාසික ප්‍රතිකාර සඳහා කොළඹ ජාතික රෝහල සඳහා ඇතුළත් වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මැද-කොළඹ රෝහලේ පහසුකම් තිබියදීත්, නේවාසික ප්‍රතිකාර සඳහා රෝගීන් වෙනත් රෝහල් කරා යොමුවීමට හඳුනාගත් හේතු තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා විසඳුම් ලෙස ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මැද-කොළඹ රෝහල සංවර්ධනය කිරීම සඳහා 2020 වර්ෂයේදී ප්‍රතිපාදන වෙන් කර තිබේද;

(ii) එසේ නම්, එම ප්‍රතිපාදන යොදවා මේ වනවිට සිදු කර ඇති සංවර්ධන කාර්යයන් හා ඒවායේ ප්‍රගතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා මෙම මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්,ඒ මන්ද?

233/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ—

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ ගුවන් යානා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම ගුවන් යානා ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම ගුවන් යානා ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට ගුවන් යානා ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

320/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ හොකී ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) ඉහත (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ හොකී ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හොකී ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා වන සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා හොකී සම්මේලනය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

486/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වී අලෙවි මණ්ඩල පනත සම්මත වූ දිනය කවරේද;

(ii) එවැනි පනතක් සම්මත කර ගැනීමේ අරමුණු කවරේද;

(iii) වී මිලදී ගැනීම සම්බන්ධයෙන් එම පනතේ ඇති නීතිමය විධිවිධාන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම පනතේ දැක්වෙන විධිවිධානවලට අනුව ශ්‍රී ලංකාව පුරා වී මිලදී ගැනීමට ක්‍රියාත්මක යාන්ත්‍රණය කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

531/2020

ගරු රෝහණ බංඩාර මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ පිහිටා ඇති පුරාවිද්‍යාත්මක වටිනාකමින් යුතු ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ස්ථානවල නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම ස්ථානවල ඓතිහාසික වටිනාකම අනාගත පරම්පරාව වෙනුවෙන් ආරක්ෂා කර දීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

564/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරග වාර්ෂිකව පවත්වන බව එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) 2020 වර්ෂයට අදාළව පළාත් පාසල් ක්‍රීඩා තරග පවත්වා තිබේද;

(ii) නොඑසේ නම්, ඒ සම්බන්ධව ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) 2020 වර්ෂයට අදාළව සමස්ත ලංකා පාසල් ක්‍රීඩා තරග පවත්වා තිබේද?

(ii) නොඑසේ නම්, එම තරග පැවැත්වීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

592/2020

ගරු. එස්.එම්.එම්. මුෂාරෆ් මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් ශ්‍රී ලංකාවේ ක්‍රීඩා ක්ෂේත්‍රයට දායකත්වය සැපයූ ක්‍රීඩකයන් රාශියක් නියෝජනය කරන පොතුවිල් ප්‍රදේශය සඳහා දීර්ඝ කාලයක් තිස්සේ පොදු ක්‍රීඩාංගණයක් නොමැතිවීමෙන් ප්‍රදේශයේ තරුණ තරුණියන් අපහසුතාවයට පත්ව ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එසේ නම්, පොතුවිල් ප්‍රදේශය සඳහා පොදු ක්‍රීඩාංගණයක් ඉදිකරනු ලබන දිනය කවරේද;

(ii) මේ සඳහා පසුගිය කාල වකවානුව තුළදී අමාත්‍යාංශය ගනු ලැබූ ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

597/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෙයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, නාගදීප වසමට අයත් එකම රජයේ රෝහල, නාගදීප රෝහල බව එතුමිය දන්නෙහිද?

(ආ) එම රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් ජනතාව පීඩා විඳින බව එතුමිය පිළිගන්නෙහිද?

(ඇ) (i) එම රෝහල සඳහා මේ වනතෙක් ස්ථිර වෛද්‍යවරයක් පත්නොකිරීමට හේතු කවරේද;

(ii) එම රෝහල සඳහා අනුමත කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු සඳහන් කරන්නේද;

(iii) එම ජනතාවට ප්‍රශස්ථ වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා නාගදීප රෝහලේ මේ වනවිට පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවනු ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

643/2020

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඌව පළාතේ පිහිටි —

(i) තල්පිටිගල ජලාශ ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතුවල ප්‍රමාදයට හේතු කවරේද;

(ii) 2015 වර්ෂයේදී මුල්ගල තබන ලද කුඹුක්කන් ඔය ජලාශ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iii) හැඩ ඔය ජලාශ ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

648/2020

ගරු මයන්ත දිසානායක මහතා,— සංචාරක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2015, 2016, 2017 හා 2018 වර්ෂවල දී ශ්‍රී ලංකාවට පැමිණි විදේශීය සංචාරකයන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංඛ්‍යාව එක් එක් රට අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම සංචාරකයන්ගෙන් ශ්‍රී ලංකාවට ලැබුණු විදේශ විනිමය ප්‍රමාණය, ඉහත එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය මඟින් පවත්වාගෙන යනු ලබන සංචාරක නිකේතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා පිහිටා ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම සංචාරක නිකේතනවල සේවය කරන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා සංචාරක ප්‍රවර්ධන කාර්යාංශය විසින් ශ්‍රී ලංකාව තුළ නව සංචාරක නිකේතන ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම සංචාරක නිකේතනවල නම් කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

656/2020

ගරු චන්දිම වීරක්කොඩි මහතා,— වෙළඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) සි/ස හබරාදූව විවිධ සේවා සමූපකාර සමිතිය මගින් පාලනය වන ග්‍රාමීය බැංකුවේ මුදල් තැන්පත් කරන ලද තැන්පත්කරුවන්ගේ මුදල්, ආපසු නොගෙවීම සම්බන්ධයෙන් යම් ගැටලුකාරී තත්ත්වයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙහිදී වංචා කර ඇති මුදල කොපමණද;

(ii) එකී තැන්පත්කරුවන්ට මේ වනවිට ගෙවා ඇති මුදල කොපමණද;

(iii) තැන්පත්කරුවන්ට තවදුරටත් ගෙවීමට ඉතිරි වී ඇති මුදල කොපමණද;

(iv) ඉතිරි තැන්පත්කරුවන්ගේ මුදල් ආපසු ගෙවන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එකී මුදල් වංචාවට අදාළ කාල වකවානුවල සිටි සභාපතිවරු ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් කවරේද;

(ii) එකී සභාපතිවරුන් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන්ට එරෙහිව ගෙන ඇති නීත්‍යානුකූල ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

780/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) එවකට පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම් සහ හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය යටතේ වවුනියාව ප්‍රදේශයේ ක්‍රියාත්මක වූ නිවාස යෝජනා ක්‍රමය යටතේ නිවාස අහිමි පුද්ගලයන්ට නිවාස ලබා දෙන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) වවුනියාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 42 අතරින් නිවාස ලබා දීම සඳහා 2019 වර්ෂයේදී හඳුනාගෙන ඇති ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

(ii) ඉහත එක් එක් ග්‍රාම නිලධාරි වසම සඳහා මේ වනතෙක් ලබා දී ඇති නිවාස සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම නිවාසලාභීන්ගේ නම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) එක් එක් ග්‍රාම නිලධාරි වසම සඳහා නිවාස වෙන් කරන පදනම කවරේද;

(ii) කල්ලිකුලම් ග්‍රාම නිලධාරි වසමේ මුල් පදිංචිකරුවන්ට සහ පසුව පදිංචි කරවනු ලැබූ අයට නිවාස වෙන් කිරීමේදී පදනම් කර ගනු ලැබූ සාධක කවරේද;

(iii) එම නිවාස වෙන් කිරීමේදී පැන නැගී ඇති ගැටලුව විසඳීමට ගනු ලබන පියවර කවරේද;

(iv) මේ වනතෙක් නිවාස ලැබී නොමැති පුද්ගලයන්ට නිවාස ලබා දෙන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

861/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මන්නාරම දිස්ත්‍රික්කයේ, මන්නාරම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් පල්ලිමුණෙයි සහ පරප්පාංකණ්ඩල් යන ගම්මානවලින් සහ නානාට්ටාන් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් වංකාලයි ගම්මානයෙන් ඉඩම් පවරාගැනීම හේතුවෙන් එම ප්‍රදේශවල ජීවත්වන ජනතාව විශාල අපහසුතාවයන්ට මුහුණදී ඇති බවත්;

(ii) 2019 වර්ෂයේදී වනජීවී අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉහත සඳහන් ගම්මානවලට පැමිණ මෙම ගැටලුව විසඳන බවට ජනතාවට පොරොන්දු වූ බවත්;

(iii) එසේ වුවද, ඉහත සඳහන් ගම්මාන තුනෙහි පදිංචි පොදු ජනතාවගේ ඉඩම් ගැටලුව මේ වනතෙක් විසඳී නොමැති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) මෙම ගැටලුව විසඳීම සඳහා පියවර ගන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා ගතවන කාලය කොපමණද;

(iii) මෙම ගැටලුව විසඳීම සඳහා වැඩසටහන ආරම්භ කරනු ලබන දිනය කවරේද;

යන්න ගරු එතුමා මෙම සභාවට දන්වන්නේහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2021 පෙබරවාරි 12 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

33/2020

ගරු හේෂා විතානගේ මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍ය, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කුරගල පුරාවිද්‍යාත්මක ස්ථානය සංරක්ෂණය කිරීම සඳහා මේ වනවිට රජය ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

140/2020

ගරු චමින්ද විජේසිරි මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය යටතේ අඩු ආදායම්ලාභී පවුල්වලට රැකියා ලබාදීමේ වැඩසටහනක් ක්‍රියාත්මක වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එම වැඩසටහන යටතේ මේ වනතෙක් ලබා දී ඇති රැකියා සංඛ්‍යාව කොපමණද;

(ii) එම රැකියාලාභීන්ගේ නම් කවරේද;

(iii) එම වැඩසටහන තවදුරටත් ව්‍යාප්ත කිරීමට අමාත්‍යාංශය ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

234/2020

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) වර්ෂ 2015 සිට 2019 දක්වා එක් එක් වර්ෂය තුළ —

(i) ශ්‍රී ලංකාවට ආනයනය කළ වාහන ප්‍රමාණය කොපමණද;

(ii) ඒ සඳහා වැය වූ මුදල කොපමණද;

(iii) එම වාහන ආනයනය කළ රටවල් කවරේද;

(iv) එම වාහන ආනයනය කළ සමාගම්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම කාලසීමාව තුළ ශ්‍රී ලංකාවට වාහන ආනයනය කිරීම සඳහා වැය වූ මුළු මුදල කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

321/2020

ගරු බුද්ධික පතිරණ මහතා,— තරුණ හා ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ටේබල් ටෙනිස් ක්‍රීඩාව දියුණු කිරීම වෙනුවෙන් 2019 වර්ෂය සඳහා වෙන් කළ මුදල කොපමණද;

(ii) එම මුදලෙන් රජයේ පාසල් සඳහා වෙන් කළ මුදල කොපමණද;

(iii) අංක (i) හි සඳහන් මුදලෙන් පාසල් හැර ගිය දරුවන්ගේ ටේබල් ටෙනිස් ක්‍රීඩා කිරීමේ හැකියාව වර්ධනය කිරීම සඳහා වෙන් කළ මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ටේබල් ටෙනිස් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර ජයග්‍රහණ ලබා ගැනීම වෙනුවෙන් පාසල් ක්‍රීඩකයන් මෙහෙයවීම සඳහා සැලසුම් සකස් කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එම පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා ටේබල් ටෙනිස් සංගමය හා ඊට අනුබද්ධ අනෙකුත් සංගම්වල පරිපාලන හා සංවර්ධන කටයුතු සඳහා රජය සම්බන්ධ වන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා සම්බන්ධ වන ආකාරය කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

489/2020

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ පිහිටි එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ පිහිටා ඇති ජාතික පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම ජාතික පාසල්වල නම් කවරේද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) අවම ජාතික පාසල් සංඛ්‍යාවක් සහිත දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසවල පිහිටි ජාතික පාසල් සංඛ්‍යාව ඉහළ දැමීමට අමාත්‍යාංශය ගනු ලබන පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

565/2020

ගරු ශාන්ත බණ්ඩාර මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) කුරුණෑගල ශික්ෂණ රෝහල මඟින් විශාල සේවාවක් සිදු වන බව එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) එම රෝහලේ ඇති වාට්ටු සංඛ්‍යාව;

(ii) එම රෝහලේ පවතින ඇඳන් සංඛ්‍යාව;

කොපමණද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ප්‍රතිකාර ලබා ගැනීම සඳහා පැමිණෙන රෝගීන්ට ප්‍රමාණවත් සේවාවක් සැපයීමට අවශ්‍ය වන පහසුකම් කුරුණෑගල ශික්ෂණ රෝහලේ පවතින්නේද;

(ii) නොඑසේ නම්, එම අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

593/2020

ගරු එස්.එම්.එම් මුෂාරෆ් මහතා,— වරාය හා නාවික අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ඔලුවිල් වරාය ඉදිකිරීමෙන් පසු ප්‍රදේශයේ වෙරළ විශාල ඛාදනයකට ලක් වන බව එතුමා දන්නෙහිද?

(ආ) (i) මේ සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග කවරේද;

(ii) මේ තත්ත්වය වැළැක්වීමට වැලි යෙදීම වැනි තාවකාලික පියවර අනුගමනය කිරීමට හේතු කවරේද;

(iii) ඛාදනය වැළැක්වීමට ඉදිරියේදී ස්ථිර පියවර ගන්නේද;

(iv) එසේ නම්, එම දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) වරාය ඉදිකිරීමෙන් ඉඩම් අහිමි වූ ජනතාවට වරාය අධිකාරිය විසින් විකල්ප ඉඩම් ලබා දී නොමැති බව එතුමා දන්නෙහිද?

(ඈ) (i) එසේ නම්, ඔවුන්ට විකල්ප ඉඩම් ලබා දෙන දිනය;

(ii) ඉඩම් අහිමිවූවන් සඳහා වන්දි ලබා දෙන දිනය;

(iii) විකල්ප ඉඩම් ලබාදීමේදී සියලු දෙනාටම පර්චස් 20 බැගින් ඉඩම් ලබාදීමෙන් සිදුවූ වරද, නිවැරදි කරනු ලබන ආකාරය;

(iv) වරාය අධිකාරිය විසින් ඉදිකළ ඔලුවිල් කටාර් නිවාස යෝජනා ක්‍රමයේ පොදු කටයුතු සඳහා ඉඩම් වෙන් කර දෙන බවට වූ පොරොන්දුව ඉටු කරනු ලබන ආකාරය;

කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

598/2020

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) යාපනය දිස්ත්‍රික්කයේ, වේලනෛයි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ වේලනෛයි ප්‍රාදේශීය රෝහල පවතින බව එතුමිය දන්නෙහිද?

(ආ) එම රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීම හේතුවෙන් ප්‍රදේශයේ ජනතාව පීඩා විඳින බව එතුමිය පිළිගන්නෙහිද;

(ඇ) (i) එම රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව කොපමණද;

(ii) එම රෝහල සඳහා මේ වනතෙක් ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(iii) ජනතාවට ප්‍රශස්ථ වෛද්‍ය සේවාවක් ලබා දීම සඳහා වේලනෙයි ප්‍රාදේශීය රෝහලේ මේ වනවිට පවතින කාර්ය මණ්ඩල පුරප්පාඩු පුරවන ලබන දිනය කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

611/2020

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— ඉඩම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුලියාපිටිය ප්‍රදේශයේ, "මහනුගලන්ද වත්ත" නමින් අක්කර 85ක පමණ විශාලත්වයෙන් යුතු සශ්‍රික පොල් ඉඩමක් තිබූ බවත්;

(ii) එය මහා භාරකාර දෙපාර්තමේන්තුවට අයත්ව තිබූ ඉඩමක් බවත්;

(iii) එය භාරයකට අයත්ව තිබූ ඉඩමක් බවත්;

(iv) මෙම ඉඩම වොක්ස්වැගන් මෝටර් රථ නිෂ්පාදනය කිරීමේ කර්මාන්ත ශාලාවක් ආරම්භ කිරීම සඳහා "වෙස්ටර්න් ඔටෝ මොබයිල්" ("Western Auto Mobile") නමැති සමාගමකට ලබා දී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) ඉහත සමාගමට මෙම ඉඩම ලබා දී ඇති පදනම සහ කාලසීමාව කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) මෙම ඉඩමෙන් කපා ඉවත් කරන ලද පොල් ගස් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පොල් ගස් අළෙවි කර ඇති පදනම කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

638/2020

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රෝහල්වල මේ වනවිට සේවය කරන වෛද්‍යවරුන් සංඛ්‍යාව අවශ්‍ය ප්‍රමාණය වඩා සියයට දහයක් පමණ අඩු බවත්;

(ii) මඩකළපුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති රෝහල්වල විශේෂඥ වෛද්‍යවරුන්ගේද හිඟයක් පවතින බවත්;

එතුමිය දන්නෙහිද?

(ආ) ඉහත රෝහල්වල පවතින එම වෛද්‍යවරුන්ගේ පුරප්පාඩු පිරවීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

772/2020

ගරු මුජිබර් රහුමාන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කොළඹ නාගරික සීමාව තුළ පිහිටි ජාතික පාසල්වල පලමු ශ්‍රේණියට ඇතුලත් වීමට අඩු පහසුකම් සහිත නාගරික ළමුන්ට නොහැකි වන තරම් බව එතුමා දන්නෙහිද?

(ආ) එසේ නම්, කොළඹ නගර සහා සීමාව තුළ පිහිටි ජාතික පාසල් සම්බන්ධයෙන්;

(i) පාසල්වල නම් කවරේද;

(ii) ආගමික හා ආගමික නොවන ලෙස වර්ගය කවරේද;

(iii) අධ්‍යයන මාධ්‍ය අනුව පාසල් සංඛ්‍යාව සහ සිංහල හා දෙමළ මාධ්‍යට වෙන්කර ඇති පංති සංඛ්‍යාව කොපමණද;

(iv) ත්‍රයිභාෂා ජාතික පාසල්වල 1 සිට 5 දක්වා ශ්‍රේණිවල දෙමළ මාධ්‍ය පංතිවල ඉගෙනුම ලබන ළමුන් සංඛ්‍යාව කොපමණද;

(v) භාෂා මාධ්‍ය, ජාතිය හා ආගම පදනම් කර ගනිමින් එක් එක් පාසල්වලට ඇතුලත් කර ගන්නා සිසුන් සංඛ්‍යාව කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) පළමු ශ්‍රේණියට ළමුන් බඳවාගැනීමේ පවතින ක්‍රියාවලිය පිළිබඳව රජය තෘප්තිමත් වන්නේද;

(ii) පරම්පරා ගණනාවක් පාසැල් ආසන්නයේ ජීවත් වන දෙමාපියන්ගේ ළමුන් සඳහා විශේෂ කෝටා ක්‍රමවේදයක් හඳුන්වාදීම මඟින් විවිධ ජාතික, ආගමික හා සමාජ පසුබිමක් සහිත සිසුන් වැඩි සංඛ්‍යාවකට අවස්ථාව ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

774/2020

ගරු කිංස් නෙල්සන් මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටි මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසල් අතරින් ගුරු හිඟය පවතින, පානීය ජල පහසුකම්, වැසිකිළි පහසුකම්, විද්‍යාගාර, පුස්තකාල සහ ක්‍රීඩා පහසුකම් නොමැති පාසල් සංඛ්‍යාව, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසල්වල නම් සහ ලිපිනයන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මෙම දිස්ත්‍රික්කයේ ඉහත අඩුපාඩුකම් සහිත පාසල් සංවර්ධනය කිරීමට රජය පියවර ගන්නේද;

(ii) එසේ නම්, එම පියවර ගැනීමට ගතවන කාලය කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

781/2020

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ මුදල් අමාත්‍යතුමා, බුද්ධශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා සහ නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) වර්ෂ 2005 සිට 2015 දක්වා එවකට ජාතික ප්‍රතිපත්ති, ආර්ථික කටයුතු, නැවත පදිංචි කිරීම්, පුනරුත්ථාපන, උතුරු පළාත් සංවර්ධන හා තරුණ කටයුතු අමාත්‍යාංශය වෙත පුනරුත්ථාපන හා නැවත පදිංචි කිරීමේ කටයුතු වෙනුවෙන් විවිධ රටවලින් සහ ආයතනවලින් ලැබුණු හා මිලදී ගත් වාහන වර්ග, ඒවායේ ලියාපදිංචි අංක සහ ඒවා භාවිතය සඳහා ලබා දෙන ලද රාජ්‍ය හා රාජ්‍ය නොවන සංවිධාන වෙන් වෙන් වශයෙන්;

(ii) එම වාහනවල වත්මන් ක්‍රියාකාරිත්වය;

(iii) මේ වනවිට එම වාහන භාවිතා කරනු ලබන ආයතන;

(iv) මේ වනවිට තලෙයිමන්නාරම පොලිසියේ රඳවා ගෙන ඇති WP RB - 2639 ලියාපදිංචි අංකය දරන ට්‍රැක්ටර් රථය භාවිතා කරන ලද අමාත්‍යාංශය හා එහි අදාළ අංශය;

කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2009 සිට 2012 දක්වා මැණික් ෆාම් අතරමැදි කඳවුරෙහි භාවිතා කළ වාහනවල වර්ග හා ලියාපදිංචි අංක;

(ii) මේ වනවිට එම වාහන භාවිතා කරනු ලබන ආයතනය හා ස්ථානය;

වෙන් වෙන් වශයෙන් කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

862/2020

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව, මුලතිව්, මන්නාරම යන දිස්ත්‍රික්කවල පිහිටි කෘෂිකාර්මික වැව් ප්‍රතිසංස්කරණය කිරීමටත්, ගොවීන්ට අයත් කෘෂිකාර්මික ඉඩම් එළි පෙහෙළි කිරීමටත් වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බාධා කරමින් සිටින බවත්;

(ii) මන්නාරම දිස්ත්‍රික් සංවර්ධන කමිටුවේ තීරණය පරිදි, මන්නාරම දිස්ත්‍රික්කයේ, මුසලි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් කායාක්කුලි ගමට ආසන්නව පිහිටා ඇති අක්කර 20ක ඉඩම ඉන්දියාවේ සිට ශ්‍රී ලංකාවට පැමිණි ජනතාව නැවත පදිංචි කරවීම සඳහා ලබා දෙන මෙන් ඉල්ලා වන සංරක්ෂණ අධ්‍යක්ෂ ජනරාල්වරයාට ලිපියක් යොමු කර මේ වනවිට වර්ෂ දෙකක් පමණ ගත වී ඇතත්, එම ඉල්ලීම මේ වන තෙක් ඉටුවී නොමැති බවත්;

එතුමා දන්නෙහිද ?

(ආ) එසේ නම්, එම ඉඩම ඉහත සඳහන් කාර්යය සඳහා ලබා දීම සඳහා පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

882/2020

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2010 වර්ෂයේදී රාජ්‍ය විශ්වවිද්‍යාල සහ රාජ්‍ය නොවන විශ්වවිද්‍යාල වෙනුවෙන් වැය කරන ලද මුළු මුදල වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) උසස් අධ්‍යාපන ව්‍යාප්තිය සහ සංවර්ධනය කඩිනම් කිරීමේ (AHEAD) ව්‍යාපෘතිය යටතේ ප්‍රදානය කරන ලද ලෝක බැංකු ණය මුදලෙහි සම්පූර්ණ වටිනාකම කොපමණද;

(ii) ලෝක බැංකු ණය හරහා උසස් අධ්‍යාපනය වෙනුවෙන් වැය කරන ලද රජයේ වියදම් ප්‍රතිශතය කවරේද;

(iii) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් ප්‍රතීතනය කරන ලද පෞද්ගලික උසස් අධ්‍යාපන ආයතන වෙත වෙන් කරන ලද ණය ප්‍රතිශතය කවරේද;

(iv) උක්ත ව්‍යාපෘතිය යටතේ සේවය කිරීම පිණිස ද්විතියන පදනමෙන් අනුයුක්ත කරන ලද අධ්‍යාපන අමාත්‍යාංශයට අයත් උසස් අධ්‍යාපන අංශයෙහි සේවක සංඛ්‍යාව කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?